කොපියක් හම්බ වුණා. හැබැයි, අත්සන් කරලා තිබුණේ නැහැ. මේකට සමහර විපක්ෂ නායකවරු අත්සන් කළාට, තමන්ගේ පක්ෂවල කෘත්‍යාධිකාරී මණ්ඩල එකකින්වත් සම්මත කරලා තිබුණේ නැහැ. ඉතින් කොහොමද මේක කිව්වේ? කොහෙන්ද මේක ගෙනාවේ? කොහොමද මෙහෙම ප්‍රකාශයක් ගැන කියන්නේ?

එදා මැයි 9වැනි දාට ඉස්සෙල්ලා සතියේ අපි සාකච්ඡා කරද්දි අපි ඔක්කෝම එකඟ වෙලා තිබුණා, මේ ආණ්ඩුව ගෙන යන්න බැරි නම්, අගමැතිතුමා අයින් වුණොත් පළමුවෙන්ම විපක්ෂ නායකතුමා කැඳවන්න ඕනෑ කියලා. එතුමාට බැරි නම් කරන්න පුළුවන් කාටද කියලා පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරමු කියලා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. අපට ආපහු නීතිඥ සංගමය වුවමනා නැහැ. සමහර පක්ෂ නායකයන් ගියා නීතිඥ සංගමයත් එක්ක සාකච්ඡා කරන්න. මට නම් ඒක තේරුණේ නැහැ. නීතිඥ සංගමයට පාර්ලිමේන්තුවට එන්න තිබුණා, අපෙන් අහන්න. ඒ වෙනුවට ඒ ගොල්ලෝ දුවගෙන ගියා, නීතිඥ සංගමයේ ප්‍රධාන කාර්යාලයට. මම එතැනට ගියේත් නැහැ, මම සම්බන්ධ වුණේත් නැහැ.

ඊළඟට මොකක්ද සිද්ධ වුණේ? 7වැනි දායි, 8වැනි දායි නීතිඥ සංගමය ගිහින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එක්ක කථා කළා. එදා කථා කළේ විපක්ෂ නායකවත්, වෙන කාටවත් භාර දෙන එක ගැන නොවෙයි. එදා කථා කළේ, දේශපාලනයෙන් තොර කවුරු හරි කෙනෙක් පත් කරන්න ඕනෑ කියලා. ඕනෑ නම් ජාතික ලැයිස්තුවෙන් ආපු මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා, ඒ පුද්ගලයා මන්ත්‍රී ධුරයකට පත් කරලා අගමැතිකම භාර දෙන්න කියලා. ඒ කථා කළේ කරු ජයසූරිය මැතිතුමා ගැන නොවෙයි. ඒ කවුරු ගැනවත් කථා කළේ නැහැ. මම දන්නවා, එදා නීතිඥවරු බලාපොරොත්තු වුණේ සාලිය පීරිස් මැතිතුමා මන්ත්‍රීවරයෙක් වෙලා, අගමැති වෙයි කියලා. ඒක රහසක් නොවෙයි. අපි ඒක දන්නවා. ඒත් 9වැනි දා ඒ වැඩේ වෙනස් වුණා. ගෝල්ෆේස් සිද්ධිය නිසා ඒක වෙනස් වුණා. මම හිතන්නේ නැහැ, එදා පාර්ලිමේන්තු කණ්ඩායමේ කවුරුවත් මේවා කථා කළා කියලා. එතැනට විපක්ෂ නායකතුමා ගියා, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ගියා. ඒ ගොල්ලන් එතැනින් පළවා හැරියා. ඒ නිසා ඒ තත්ත්වය වෙනස් වුණා. එතකොට හිතුවා, නිර්පාක්ෂික අගමැතිවරයෙක් සොයා ගන්න එක තවත් හොඳ වෙයි කියලා. මෙතුමා ගිහින් එදා ඒ යෝජනාව ප්‍රතික්ෂේප කළා. මම ඒ ගැන වාද කරන්නේ නැහැ. මම හිතන විධියට සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමාත් එතැනට ගියා. බලාගෙන සිටියා, නිර්පාක්ෂික අගමැතිවරයෙකුට එන්න කියයි කියලා. සූට් පවා මහගෙන ලු හිටියේ. විපක්ෂ නායකතුමා ඒක භාර ගත්තේ නැහැ. ඒ නිසා සූට් පවා මහගෙන ලු හිටියේ. ඔබතුමන්ලාගේ වැරැද්ද. ඔබතුමන්ලා ගිහින් කිව්වා ජනාධිපතිතුමාට මා කැඳවන්න කියලා. ඊට පස්සේ මට ඇවිල්ලා කරදර කළා, ජනාධිපතිතුමා කථා කළොත් එපා කියන්න එපා, ගිහිල්ලා හම්බවෙන්න කියලා. මොකක්ද, ඔබතුමන්ලා කරපු වැඩේ කියලා බලන්න. ඒ සූට් එකටවත් ගෙවන්නකෝ. *[බාධා කිරීමක්]* එහෙම නෙමෙයි, එතුමාගේ සූට් එකට ගෙවන්න ඕනෑ නේ. තමුන්නාන්සේලා නිසා විශාල නාස්තියක් වුණා. එච්චරයි වුණේ. ඊට පස්සේ අහඹරුවාදා දවසේ කිසිම දේශපාලන පක්ෂයකට පාර්ලිමේන්තු කණ්ඩායමට රැස් වෙන්න පුළුවන් වුණා කියලා මම හිතන්නේ නැහැ. ඊට පස්සේ ඒ ගැන මෙහිදී කථා කරලා තිබුණා. මට මතක හැටියට ගරු මනුෂ නානායක්කාර මැතිතුමා සහ ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා කිව්වා, දැන් මේක භාර ගන්න කියලා. *[බාධා කිරීමක්]* ඒක තමයි. ඊට පස්සේ ඔබතුමන්ලා වෙන්වෙලා ගියා. ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කිව්වා, අපි භාර ගත්තේ නැත්නම් රනිල් වික්‍රමසිංහ භාර අරගෙන මොකක්ද කරන්නේ කියලා. ඒක තවම හිත හිත ඉන්නවා. එච්චරයි වුණේ. කමක් නැහැ, මම සජබයට කිසිම වෝදනාවක් කරන්නේ නැහැ. සිද්ධ වුණු දේ මම කිව්වේ.

ඊට පස්සේ මොකක්ද වුණේ? සුමන්තිරන් මන්ත්‍රීතුමා ඒ රැස්වීම්වලට ආවා නේ. එතැන කිව්වා නේ මේකෙදී මේ මිනිස්සු විතරක් නොවෙයි, අපේ බලවේගත් ක්‍රියාත්මක වුණා කියලා. එතකොට සමහරු හිතුවා, ඒ අරගළය තවත් අන්ත වෙයි කියලා. සමහරු හිතුවා, ඒක ද්‍රවිඩ ඩයස්පෝරාව කළා කියලා. ඒක වුණේ නැහැ. මම මෙතැන ඉන්න අනෙක් ද්‍රවිඩ පක්ෂවල අනෙක් මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවා. එතුමා ඩයස්පෝරාවත් එක්ක එච්චර සම්බන්ධ නැහැ. ඒ අය එතැනට සම්බන්ධ වෙලා නැහැ. අන්තරයත් එක්ක හිටපු අයත් කිව්වා, අපි කිසි කෙනෙක් එතැන සිටියේ නැහැ, අපි හිතුවා රාජපක්ෂලාට සිංහල ජනතාවගේ සහයෝගය තිබෙනවා කියලා යනුවෙන්. එක්කෙනෙක් කියනවා, මේවා අපට කරන්න බැහැ, අපට යාපනයෙන් 1,000ක් එකතු කරන්න බැහැ. නමුත්, අපට පුළුවන් නම් කොළඹින් මෙච්චර සංඛ්‍යාවක් ගේන්න, අපි මොකටද මේ වාගේ දේවල් කරන්නේ, අපි ගිහිල්ලා බලය අල්ලා ගන්න ඕනෑ කියලා. මොකක්ද, මෙතැන තිබෙන බලවේගය? එතුමා මෙතැන හිටපු නැති එක ගැන මම කනගාටු වෙනවා. ඒ වෙලාවේ අපි කිව්වා නේ මේක මීට වඩා අමාරු තත්ත්වයකට යනවා කියලා. ඒක වුණා නේ. ජූලි 9වැනි දා සංවිධානාත්මකව ඇවිල්ලා ජනාධිපතිතුමා පන්නලා, ඊට පස්සේ මගේ නිවසට ගිනි තැබුවා. ඒ ගැන කථා කරන්න අපි නායකයන් කැඳෙව්වාම මොකක්ද සිද්ධ වුණේ? අපි දන්නේත් නැහැ, කථානායකතුමා අපට කථා කරන කොට, විපක්ෂයේ නායකවරු කථානායකතුමාගේ ගෙදර. එතැනදී මොකක්ද කිව්වේ?

මගෙන් ඇහුවාම මම කිව්වා, ඔව්, ජනාධිපතිතුමා ඉවත් වෙනවා නම් - බහුතරයක් තිබෙන පුද්ගලයෙකු ඉදිරිපත් වුණොත් එතකොට මම අයින් වෙන්න ඕනෑ. කොහොමත් මට අයින් වෙන්න සිදු වෙනවා නේ. හෙට හෝ බහුතරයක් තිබෙන පුද්ගලයෙකු හිටියොත් ඔහුට අගමැතිකම ගන්න පුළුවන්, ඒකයි නීතිය කියලා. නැහැ, නැහැ. අයින් වෙන්න කිව්වා. මම ඇහුවා, කොහොමද මම අයින් වෙන්නේ, කවුද එතකොට හිඩැස පුරවන්නේ කියලා. කාටවත් බහුතරයක් තිබුණේ නැහැ. ඒ වෙලාවේ වෙන බලවේගයක් තිබුණාද ඒකට? එදා වෙන බලවේගයක් තිබුණාද? කොහොම හරි මට පුළුවන් වුණා, සඳුදා ගිහිල්ලා කැබිනට් මණ්ඩලය රැස් කරලා මුණ ගැහෙන්න. ඒ පාර හිතුවා, දැන් මේක හරියන්නේ නැහැ, ආපහු ගන්න ඕනෑ කියලා බදාදාට ලෑස්ති වුණා. එදා ඉස්සෙල්ලාම මොකක්ද කළේ? අගමැති කාර්යාලය අල්ලා ගත්තා. අගමැති කාර්යාලයට ගැහුවා. එතැන ඉඳන් පාර්ලිමේන්තුවට එන්න හැදුවා. ආපසු මෙතැනට පක්ෂ නායකයන් රැස් වුණා. පාර්ලිමේන්තුව බෙරා ගන්න බැලුවාද?

කවුරු කවුරුද කිව්වේ, මේකයි කරන්න ඕනෑ කියලා? ඒ සියල්ල පාර්ලිමේන්තුවේ වීඩියෝගත කරලා තිබෙන්නේ. අන්තිමට මොකක්ද වුණේ? ඒ අයට ඕනෑ වුණේ ආණ්ඩුව මාරු කරන්න මිසක්, පාර්ලිමේන්තු බලය ගන්න නොවෙයි. ආණ්ඩුවට බහුතරයක් නැත්නම් කොහොමත් ඉන්න ආණ්ඩුවට ගෙදර යන්න සිදු වෙනවා. ඒක කළේ නැහැ. ඒ පාර තමයි මට සිදු වුණේ හමුදාවට කියන්න, කොහොම හරි මේක ආරක්ෂා කරන්න කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව යටතේ තිබෙන පාර්ලිමේන්තුවේ බලතල නැති කරන්න ගියේ. පාර්ලිමේන්තුවේ බලතල හා ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන්න ගියේ. ඒවා ගැන විභාග කරන්න බලය අපට තිබෙනවා. මම කියන දේ සුමන්තිරන් මන්ත්‍රීතුමා පිළිගන්නේ නැත්නම් මෙතැනට ඇවිල්ලා වාද විවාද කරන්න වුවමනා නැහැ. පාර්ලිමේන්තුවේ කමිටුවක් පත් කරලා ඒ ගැන හොයලා බලන්න. අපිත් බලන්නේ, මේක පිටුපස්සේ තිබුණු ඒ බලවේගය මොකක්ද කියලායි. කවුද මේක සංවිධානය කළේ අර Arab Spring එක වාගේ, Orange Revolution එක වාගේ? නැත්නම් මෙහේ බලය අල්ලා ගන්නවා.

ගෙදර පිවිසුවා කියලා මම පැනලා ගියා නම් එතැන හිඩැසක් ඇති වෙනවා, බලය ගන්න. නැත්නම් පාර්ලිමේන්තුව වටකර ගත්තා කියලා මෙතැනට එනවා. අපි ඒවා පාලනය කරන තැනට

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ආවා. අපි ඒවා ගැන හොයලා බලමු. මට නම් ප්‍රශ්නයක් නැහැ. විපක්ෂ නායකතුමාටවත්, ඒ පක්ෂයටත් මම කිසි දවසක චෝදනා කරන්නේ නැහැ. ඔබතුමන්ලාත් ප්‍රජාතන්ත්‍රවාදියි. ඒක මම ඉගැන්වූවා. ඒක නිසා එතැන ප්‍රශ්නයක් නැහැ. එහෙත් මොකක්ද වුණේ කියලා මම අහන්න කැමැතියි. මෙතුමා ඊයේ ප්‍රකාශ කරපු නිසා මට සිදු වුණා, මෙතැනට ඇවිල්ලා මේවා කියන්න. නැත්නම් හිතයි, අපි එකඟ වෙලා ඊට පස්සේ පැනලා ගියා කියලා. කවුද මෙතැන හිටියේ? කවුද කෝට් මහලා තිබුණේ? කවුද බලාගෙන හිටියේ? හිතුවාද, විපක්ෂ නායකතුමා ගත්තේ නැත්නම් මටයි ඒක එන්නේ කියලා? ඒකට සම්බන්ධ වුණු හැම කෙනාම කවුද ආරක්ෂා කළේ? කාගේ නීතිඥයෝද ගියේ? මොකක්ද සිදු වුණේ?

මුල් වතාවට අප්‍රේල් මාසයේ පාර්ලිමේන්තුව වට කරද්දී මොකක්ද සිදු වුණේ? ඒ වෙලාවේම නීතිඥයෝ 25ක්, 30ක් මහෙස්ත්‍රාත් උසාවියට ගිහිල්ලා ඒ අය නිදහස් කර ගත්තා. මහෙස්ත්‍රාත්ගේ යුතුකම විධියට තිබුණේ ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවෙන් අහන්න. ඔක්කෝම යට වුණා. ඒ අය හැම තැනකටම පැනගෙන ගියා. ඒ නීතිඥවරු ඒ ගොල්ලන් බේරා ගන්න ගියා. ඒක සාධාරණයි. ඒ අය බේරා ගත්තේ නැත්නම් ඒ ගොල්ලන් කථාව කියනවා. ඒ ගැන මම කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මගේ මිත්‍ර මන්ත්‍රීතුමාට මේ ගැන ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපි ඒ ගැන බලන්න කමිටුවක් දමමු. මටත් ආවේ ආරංචි විතරයි නේ. ඒවා ඇත්තද, නැද්ද කියලා හොයලා බලන්න පුළුවන්. *[බාධා කිරීමක්]* මම හිතුවා, මරික්කාර් මන්ත්‍රීතුමා නැතිවිටෙ මාත් එක්ක හැප්පෙන්න කියලා. එහෙම නැහැ නේද? අපේ ප්‍රශ්නයක් නැහැ. මම එහෙම නම් යන්නම්. *[බාධා කිරීමක්]* මම ඔබතුමා ගැන මොකුත් කිව්වේ නැහැ. සුමන්තිරන් මන්ත්‍රීතුමාත්, - *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ජනාධිපතිතුමනි, යන්න එපා. ගරු ජනාධිපතිතුමනි, යන්න එපා. ජනාධිපතිතුමා මොකද යන්නේ? මොකද යන්නේ? මට මයික් එක දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට මයික් එක දීලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ජනාධිපතිතුමනි, මොකද යන්නේ? ඇයි බය වෙලාද යන්නේ? කොහේද යන්නේ? අයියෝ! යනවා නේ. මොකෝ යන්නේ? *[බාධා කිරීමක්]* මට අවස්ථාව ඕනෑ කථා කරන්න. මට මයික් එක දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂ නායකතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට මයික් එක දීලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරයා එතුමාගේ ප්‍රකාශය කරලා මෙතැනින් ඉවත් වෙලා ගිය එක ගැන මම කනගාටු වෙනවා. විශේෂයෙන්ම මම එතුමා සභාවේ සිටින මොහොතේ උත්සාහ කළේ එතුමා කථා කළ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

උත්තර දෙන්න නොවෙයි. මේ වෙලාවේ ගැලරියේ පාසල් දරුවන් ඉන්නවා, ගුරුවරු ඉන්නවා, දෙමව්පියන් ඉන්නවා. විශේෂයෙන්ම ජනාධිපතිවරයා මේ සභාවේ රැඳිලා සිටියා නම් ඇත්ත වශයෙන්ම මම අදහස් කළේ- *[බාධා කිරීමක්]*

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - மின்சக்தி மற்றும் வலுசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Power and Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් රාජ්‍ය ඇමතිතුමා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අද වැදගත් විවාදයක් යන්නේ. ඊයේ සුමන්තිරන් මන්ත්‍රීතුමා කළ කථාවකට තමයි ජනාධිපතිතුමා අද උත්තරයක් දුන්නේ. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ වෙලාව ගන්න එපා. *[බාධා කිරීම්]*

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
විපක්ෂ නායකතුමා සුමන්තිරන් වෙලා හරියන්නේ නැහැ. විපක්ෂ නායකතුමාට ඕනෑ ඕනෑ වෙලාවට, උදේ පාන්දර කෑ ගහන්නයි, මේ වාගේ කාලය ගත්තාමයි අපට මේ විවාදය ගෙනියන්න බැහැ. කරුණාකරලා අපට විවාදය කරගන්න ඉඩ දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, මේ විවාදය යන අවස්ථාවේ තමයි ඔබතුමාට කාලය ලබා දුන්නේ. ඔබතුමා ඉතා කෙටියෙන් අදහස් දැක්වීම කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Videography එක දාන්න. ඇත්ත වශයෙන්ම මම අදහස් කළේ - *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඉතාම කෙටියෙන් කියලා අදහස් දැක්වීම අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.